# පරිසරය ඇසුරු කරගෙන අත්දැකීම් තුළින් කතන්දර ගොතමු.

කුඩා කල පටන් ඔබ බොහෝ කතන්දර අසා හෝ කියවා ඇත.ඒවා බොහෝමයක් පරිසරය ආශ්‍රිතව නිර්මාණය වී ඇති බව නොරහසකි.

උදා :

- හාවා සහ නරියා ලබු කිරිබත් කෑ හැටි
- හීල් බත් දංකුඩ
- හාවාගෙයි ඉබ්බාගෙයි රේස් එක

මෙකී සියලු කතා පරිසරය ආශ්‍රිතව නිර්මාණය වී ඇත.

එදා නිර්මාණකරුවන් සිය පරිකල්පනය මෙහෙයවා සිදුකළ නිර්මාණ අදටත් ළමා ලෝකය තුළ ජනප්‍රිය ව ඇත. මෙලෙස ඔබටද පරිසර අත්දැකීම් මූලික කොටගෙන අපූරු වූ නව නිර්මාණ කළ හැක. ඔබ කතන්දරයක් ගෙතීමට සූදානම් වුවහොත් පළමුව එහි මුල, මැද, අග මනාව ගැලපිය යුතුය. එහි දී අපට පරිසරයේ වෙසෙන සතුන්, ගස් වැල්, ගංගා, ඇළ දොළ, වලාකුළු ආදිය යොදා ගනිමින් කතන්දර නිර්මාණය කරගත හැක.

ජනශ්‍රැතිය තුළ මෙවැනි කතන්දර බහුලය. ජන සාහිත්‍යයේ මෙතෙක් බිහි වූ කතන්දර ගොන්නට ඔබට අලුත් කතන්දර ගොඩනගා එකතු කළ හැක.

පළමුව කෙටි කතන්දරයක් නිර්මාණය කර ඉන්පසු ඉහත සඳහන් කළ දෑ එහි තිබේදැයි විමසන්න. කියවා කපා කොටා නැවත ලියා අවසානයේ හොඳ රසවත් නිර්මාණයක් ඔබට ලැබෙනු ඇත.

පැවරුම් :

පහත අත්දැකීම් පාදක කර කතන්දර ගොඩනගන්න.

- පූසෙක්, කේක් කෑල්ලක්, බල්ලෙක්, කේක් කෑල්ලට මාන බලන කපුටෙක්, රැවටීමක්
- මඩ වළක නෙළුමක්, මී මැස්සෙක්, නිල මැස්සෙක්, සමනලයෙක්, මල් නෙළන ළමයෙක්
- කුඹුරක් මැද සිදෙමින් පවතින දිය වළක්, මාළු දෙදෙනෙක්, තත්තුවටෙක්, දිය වළ දෙස බලා සිටින කොකෙක්